WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

සංගීතය (පෙරදිග) I, II
சங்கீதம் (கீழைத்தேய) I, II
Music (Oriental) I, II

## සංගීතය (පෙරදිග) II

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) "සරිගරිස-, සරිගපගරිස-" යනු නිර්දේශිත රාගයකට අයත් ස්වර අභ්‍යාසයක මුල් ස්වර ඛණ්ඩ දෙකකි. මෙම ස්වර අභ්‍යාසයේ ඊළඟට යෙදෙන ස්වර ඛණ්ඩය ලියන්න.

(ii) "සරිගුමපධුනිස්" යන ස්වර සමග 'රිගම්ධනි' යන විවාදී ස්වර පහක් යෙදෙන රාගයේ නම කුමක් ද?

(iii) 'ගයමු වයමු රසය බෙදමු මියැසි රස පෙරා' මෙම ගී පාදය ප්‍රස්තාර කිරීමේ දී පැහැදිලි ව පෙනෙන තාල ලක්ෂණය අනුව, පහසුවෙන් ප්‍රස්තාර කළ හැකි වන්නේ කුමන තාලය මත ද?

(iv) 'ඒ බුදු බව පතමින ලොබිනේ' යන නාඩගම් ගී තනුවට අනුව 'මෑ වේ මා දුටු කොමළ ලියා' යනුවෙන් ගීතයක් නිර්මාණය වී ඇත්තේ කුමන නව නාට්‍යයේ ද?

● අංක (v) සිට (viii) තෙක් හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(v) 'සිරි බුද්ධගයා විහාරේ', 'මහ බෝධි මූලේ' යන ගීත නම් කරනුයේ ....................... ගීත වශයෙනි.

(vi) ගුවන් විදුලි සරල ගීතයට මුල් අඩිතාලම සැකසුවේ ....................................... සූරීන් ය.

(vii) ගැල් ගී, පැල් ගී, පාරු ගී යන ගීත විශේෂ තාලයකින් තොර ව ගයනු ලබන නිසා ඒවා ........................ මෙහෙ ගී වශයෙන් හැඳින්විය හැකි ය.

(viii) 'හෙළ ගී මග' නමින් පර්යේෂණ ග්‍රන්ථයක් ඉදිරිපත් කරමින් දේශීය ජන සංගීතයේ උන්නතියට දායක වූ සංගීතඥයෙක් ලෙසට ................................... සූරීන් අගය කළ හැකි ය.

● අංක (ix) සහ (x) හි දක්වා ඇති රංග සම්ප්‍රදායන් සමග ගැළපෙන කරුණු **දෙක** බැගින් වරහන් තුළින් තෝරා අදාළ ප්‍රශ්න අංකය ද සමගින් පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(පසන්, සබේ විදානේ, කෙහෙර්වා, අලගනායිදු, විශ්වනාත් ලව්ජී, තානායම් පොළ)

| | | |
|---|---|---|
| (ix) නාඩගම් | ................................ | ................................ |
| (x) නූර්ති | ................................ | ................................ |

**2.** පහත දැක්වෙන ස්වර ඛණ්ඩ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - නිසගුම, ධු-ප-, මගුරිස-

B - නිරිගරිස-, නිධනිරිගරිස-

(i) ඉහත දැක්වෙන ස්වර ඛණ්ඩ අයත් වන රාග **දෙක** පිළිවෙළින් නම් කරන්න.

(ii) ඉහත ස්වර ඛණ්ඩවලට අදාළ රාග දෙකෙන් **එක්** රාගයක් තෝරා ගෙන, ඊට අයත් මධ්‍යලය ඛ්‍යාල් ගීතයක ස්ථායි අන්තරා කොටස් ගීත ස්වර ප්‍රස්තාර කරන්න; **නැතහොත්** වාදිතයක ස්ථායි අන්තරා කොටස් ප්‍රස්තාර කර ඊට උචිත මාත්‍රා අටකට නො අඩු තානාලංකාර දෙකක් තාලානුකූල ව ප්‍රස්තාර කරන්න.

(iii) ඔබ තෝරා ගත් රාගයට අදාළ ව ආරෝහණ, අවරෝහණ, වාදී, සංවාදී යන රාග විස්තර සපයන්න.

[ශ්‍රේවැනි පිටුව බලන්න

0001466

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**3.** පහත වගුවේ දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.


(i) A, B, C ස්වර ප්‍රස්තාර කොටස් අයත් වන රාග නම් කර, ඒ ඉදිරියෙන් එම ප්‍රස්තාර කොටස්වලට අදාළ තාල නම් කරන්න.

| | ස්වර ප්‍රස්තාර කොටස | රාගයේ නම | ප්‍රස්තාරයට අදාළ තාලයේ නම |
|---|---|---|---|
| A | ස රි / ගු - ම / ප ප / ප - ප /<br>ම ප / නි - නි / ධ ධ / ප - ප / | | |
| B | ග - රි / ස - ස රි / ග ප ධ / ප - - - /<br>ග ප ධ / ස̇ - ධ ප / ග - රි / ස - - -/ | | |
| C | ග ප ම ග / ම රි ස - / ස ග ම රි / ග ම ප - /<br>ග - ම රි / ග ප ධ නි / ස̇ නි ධ ප / ම ග රි ස / | | |


(ii) A, B, C ස්වර ප්‍රස්තාර කොටස්වලට අදාළ තාලවලට අයත් ශේකා මාත්‍රා සහ තාල සංඥා දක්වමින් ප්‍රස්තාර කරන්න.

(iii) ඉහත රාගවලට අයත් සර්ගම්වල ස්ථායි කොටස් ස්වර ප්‍රස්තාර කරන්න.

**4.** (i) පහත රූපසටහන්වලින් දැක්වෙන සංගීත භාණ්ඩ හඳුනාගෙන පිළිවෙළින් නම් කරන්න.




රූපසටහන **01**




රූපසටහන **02**

WWW.OLEVELAPI.COM

(ii) පහත (අ) සහ (ආ) කොටස් අතුරෙන් **එකකට** පමණක් පිළිතුරු සපයන්න.

(අ) රූපසටහන **01** හි අංක 1 සිට 8 දක්වා ලකුණු කර ඇති ස්වර නියමිත ස්වර සංඥා සමග අංක පිළිවෙළට ලියා **A** සිට **D** දක්වා කොටස් නම් කරන්න.

(ආ) රූපසටහන **02** හි අංක 1 සිට 8 දක්වා ලකුණු කර ඇති අවනද්ධාක්ෂර සහ **A** සිට **D** දක්වා කොටස් නම් කරන්න.

(iii) ඉහත (ii) කොටස සඳහා ඔබ තෝරාගත් සංගීත භාණ්ඩය වාදනයට සුවිශේෂී වන භාරතීය සංගීතඥයකු පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න.

[අටවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

5. (i) පහත සඳහන් ගැමි ගී පාද අදාළ වර්ගය අනුව වෙන් කරමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

- දුම්බර කන්ද පාමුල මිනිරන් පතලේ
- රන් දැකැති ගෙන නිති සැරසෙනවා
- එක පඳුරෙන් ලී සයක් කපා ගෙන
- අතට වෙරළු ඇහිඳ ගෙනේ
- බුද්ධං සරණේ සිරස දරා ගෙන
- ඉහළ වෙලේ තියෙන බැතා
- තන්ඩලේ දෙන්නා දෙපොලේ දක්කනවා

| | ගැමි ගී වර්ගය | නිර්මාණයට පදනම් වූ හේතු සාධක | ගීයේ විශේෂත්වය | නිදර්ශන ලෙස ගැමි ගී පාද |
|---|---|---|---|---|
| A | මෙහෙ ගී | | අනාඝාතාත්මක | |
| | | | ආඝාතාත්මක | |
| B | සමාජ ගී | | කෙළි ගී | |
| | | | දරු නැළවිලි ගී | |
| C | බැති ගී | | තුන් සරණේ ගී | |

(ii) ඔබ කැමති වන්නමක කවියක හෝ ප්‍රශස්තියක මුල් කොටස ලියා දක්වන්න.

(iii) වන්නම් හෝ ප්‍රශස්ති අතුරෙන් **එක්** වර්ගයක් තෝරාගෙන එම ගී වර්ගයේ සුවිශේෂ ලක්ෂණ ඇතුළත් කෙටි සටහනක් පිළියෙල කරන්න.

6. පහත දැක්වෙනුයේ සරල ගීතයකට අයත්, අපරදිග ස්වර ප්‍රස්තාර කොටසකි.



(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න.

(ii) ඔබ විසින් ප්‍රස්තාර කළ පෙරදිග ප්‍රස්තාර කොටස පහත සඳහන් කොටස් එක් කරමින් ව්‍යවහාරික සංගීත ප්‍රස්තාර කොටසක් ලෙස සංවර්ධනය කරන්න.

- පළමු විභාග හතරට Repetition Mark යොදන්න.
- සෑම විභාගයක් මත ම ස්කේලයට අදාළ ව කෝඩ්ස් (Chords) යොදන්න.
- ප්‍රස්තාර කොටසේ අගට සහ මුලට Sign to Sign යොදන්න.

(iii) ඉහත පෙරදිග ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයට (F-Major Scale) පෙරලා ප්‍රස්තාර කරන්න.

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** තෝරාගෙන උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීත හා සංගීත ක්ෂේත්‍රය තුළ දී එම නිර්මාණකරුවන් දැක්වූ දායකත්වය

(ii) ශ්‍රී ලංකා ගුවන් විදුලිය ආශ්‍රිත ව ගොඩනැගුණු කණ්ඩායම් ගීතවල සාධනීය ලක්ෂණ

(iii) සර්පිනාවක් භාවිතයේ දී එය දිගු කාලයක් රැක ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු කරුණු **හෝ** සර්පිනාවක වාදන නිපුණතාවය වර්ධනය කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග

(iv) උතුරු ඉන්දීය චිත්‍රපට සංගීතයේ රාගධාරී පසුබිම

(v) වයලීනය පිළිබඳ තොරතුරු ඇතුළත් දෘශ්‍ය උපකරණයකට අඩංගු කළ යුතු කරුණු

* * *

www.olevelapi.com

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....